ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 5වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU5551- ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපනයේ පදනම**

කාලය - පැය තුනයි. (03)

දිනය - 2025.06.08 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

I වන කොටසේ ඇති සියලුම ප්‍රශ්නවලට සහ II වන කොටසේ ඇති ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

## I - වන කොටස

01. "අධ්‍යාපනය" යන පදය සුදුසු අර්ථ දැක්වීමක් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

02. "අධ්‍යාපනික න්‍යාය" යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

03. සංස්කෘතිය සහ සමාජානුයෝජනය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

04. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රවණතා තුනක් (03) සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

05. අවිධිමත් අධ්‍යාපනය පිළිබඳ සංකල්පය විස්තර කරන්න.

06. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සහ සංවර්ධනය අතර සම්බන්ධතාවය කෙටියෙන් සාකච්ඡා කරන්න.

07. ඉගෙනුම් ඵලයක් යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? තර්කානුකූලව විමර්ශනය කරන්න.

08. ප්‍රාථමික සාමාජානුයෝජනයේ වාසි පහක් (05) සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

ලකුණු 05 X 08 =40

## 02 - වන කොටස

09. I. මාරියා මොන්ටිසෝරි ඉදිරිපත් කරන ලද ප්‍රධාන දාර්ශනික අදහස් තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 03)

II. ඉහත සඳහන් අදහස් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලාව සංවර්ධනයට දායක වන ආකාරය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 08)

III. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන පන්ති කාමරවල ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී මාරියා මොන්ටිසෝරිගේ අදහස් භාවිතා කළ හැකි ආකාරය උදාහරණ සමඟ විස්තර කරන්න.

(ලකුණු 09 )

10. I. ද්විතියික සමාජානුයෝජනය පිළිබඳ සංකල්පය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 )

II. පාසල තුළ ළමුන් සඳහා සමාජානුයෝජනයට අවස්ථා ලබා දෙන විට ප්‍රාථමික පාසල් ගුරුවරයාගේ වගකීම් උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 07 )

III. "ප්‍රාථමික පාසලේ දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා සමාජානුයෝජනය ඉතා වැදගත්" ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? ඔබේ පිළිතුර සඳහා හේතු හතරක් (04) ලියා දක්වන්න. (ලකුණු 08 )

11. I. වටිනාකම යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? සුදුසු අර්ථ දැක්වීමක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 06 )

II. අධ්‍යාපනික පසුබිම තුළ වටිනාකම් (අගයයන්) වල කාර්යයන් තුනක් (03) විස්තර කරන්න. (ලකුණු 07 )

III. ප්‍රාථමික පාසල් ගුරුවරියක් ලෙස, ප්‍රාථමික පාසල් දරුවන්ගේ සදාචාරාත්මක වටිනාකම් සංවර්ධනය කිරීම සඳහා ඔබ භාවිතා කරන උපාය මාර්ග මොනවාද? (ලකුණු 07 )

12. I. "යාව ජීව අධ්‍යාපනය" යන යෙදුම පැහැදිලි කරන්න. (ලකුණු 05 )

II. යාව ජීව අධ්‍යාපනය සහ ඉගෙනුම් සමාජය අතර සම්බන්ධය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 07)

III. යාව ජීව අධ්‍යාපනය පිළිබඳ සංකල්පය සමාජයේ සෑම පුද්ගලයෙකුටම වැදගත් වන්නේ ඇයි? උදාහරණ හතරක් (04) භාවිතා කරමින් විස්තර කරන්න. (ලකුණු 08 )

13. පහත සඳහන් ඕනෑම දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. ජෝන් ඩූවින්ගේ (John Dewey) දාර්ශනික අදහස්.

II. ශ්‍රී ලාංකික සමාජය තුළ සමාජ පන්තිය. (Social Class)

III. ශ්‍රී ලංකාවේ නොවිධිමත් අධ්‍යාපනය. (Non-formal Education)

IV. දැනගැනීමට ඉගෙනුම. (Learning to Know.) (10 X 02= ලකුණු 20)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*